සැ. යු.- 2011.07.15 දින පළවූ අංක 1715 දරන ගැසට් පත්‍රයේ I-III, II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,716 - 2011 ජූලි මස 22 වැනි සිකුරාදා - 2011.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 306 |

*සැ. යු.-* රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත 2011 ජූලි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

කාර්මික ආරවුල් (සංශෝධන පනත් කෙටුම්පත 2011 ජූලි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

275 - B 0 80243—2,200 (2011/07)
D 1 -

# විවිධ දැන්වීම්

## පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ශ්‍රියානි විජේවික්‍රම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝග යටතේ "පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නාවූ ඉහත කී සංගමය සංස්ථාගත කිරීමයි.

1. දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ දර්ශනයට අනුගත වීමට එකඟත්වය පල කරන අය පමණක් පදනමට බඳවා ගැනීමටත් එම දර්ශනයට අනුකූල ලෙස සිය කාර්යභාරය ඉටු කිරීමට හැකිවන පරිදි චර්යාධර්ම පද්ධතියක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම, එම දර්ශනය මඟින් රටට ලබාදීමට ඇති උපරිම සේවාවක් ලබාදීම පිණිස ඒවා සොයා බලා එකතු කොට රක්‍ෂණය කර තැන්පත් කිරීම සහ ඒ පිළිබඳ පර්යේෂණය කොට ඒවා ක්‍රමවත්ව සම්පාදනය කිරීම,

2. දිවංගත පිලිප් ගුණවර්ධන මැතිතුමා සැමරීම පිණිස ගුණානුස්මරණ උත්සව කටයුතු සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම, සහ

3. අධ්‍යාපනික ආයතන සහ පාසල් ඉදිකිරීම හා පවත්වාගෙන යාමෙන් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම,

යනාදිය වේ.

2011 අප්‍රේල් මස 27 වැනි දින.

ශ්‍රියානි විජේවික්‍රම,
දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී.

07-594

---

## ශ්‍රී ලංකා ප්‍රජා ඖෂධවේදීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

සුනිල් හඳුන්නෙත්ති වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ ශ්‍රී ලංකා ප්‍රජා ඖෂධවේදීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි. යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි.

1. ඖෂධවේදීන්ගේ කීර්තිනාමය ආරක්ෂා කිරීම, පවත්වාගෙන යාම හා උසස් කිරීම
2. සාමාජිකයින්ගේ වෘත්තීය ගැටලු විසඳාගැනීමෙහි ලා සහාය වීම
3. ආධුනික ඖෂධවේදීන්ට මුහුණපෑමට සිදුවන අසාධාරණ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීම

යනාදිය වේ.

සුනිල් හඳුන්නෙත්ති,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

07-468

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.